සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය (සැකසුම -ඩබ්ලිව් .සී.සමරසිංහ )

අගෝස්තු මාසය - 3 සතිය පුනරීක්ෂණ අංක - 3

1)සුදුසු යුගල පද යොදා මෙම ඡේදයේ හිස්තැන් පුරවන්න

ඔවුන්ගේ .................... නැති කතාව නැවැත්වූයේ එතැනට ආ සිරිපාල අයියා නිසා ය. ............. කිසි වැඩක් නොකර ................. දොඩමින් කාලය කා දැමීම ගැනත් අම්මාට ..................... නොකර සිට .................. දෙයක් කෑමට පමණක් බලා සිටින බාල සොයුරියන් දෙස ඔහු නොරිස්සුම් බැල්මක් හෙළුවේ ය.

(උයනපිහන , අනංමනං , උදවුපදවු ,ලවක්දෙවක් , ගෙදරදොරේ ) (2 ×5 )

2) පාසලේ ක්‍රීඩා නායක තනතුර සඳහා ඔබේ තොරතුරු ඇසුරෙන් පරිගණක ක්‍රමයට ආකෘති පත්‍රයක් සකසන්න.

( 20 )

3)යා කරන්න

| | |
|---|---|
| සඳ | සුදු |
| ලතා | පුෂ්පය |
| නෙළුම | සිසි |
| ධවල | වැල් |
| කුසුම | සියපත |

(1 ×5 )

4) මෙම වචන සඳහා විරුද්ධ පද ලියන්න

1.නිවැරදි - ......................

2.අවුල් - ......................

3.ආගමන - ......................

4.සිරිත් - ......................

5.සාමාන්‍ය - ...................... (1 ×5 )

5)මෙම ඡේදය හොඳින් අවබෝධ කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

...යටත්පිරිසෙයින් හැඳ-කළාල කෙට්ට - මාවුලා ආදිය දැ'යි තමන් දෙපක්ෂය සන්තක සියල්ලක් ම විකොට කැවූ ය. ඒ හැම විකොට කා නිමවාලා තමන් දෙපක්ෂය සන්තක සියල්ලක් ම විකොට කැවූ ය. ඒ හැම විකොට කා නිමවාලා මාලු අවස්ථාවෙහි දී හිඳිනා ගෙයත් වික්කහ. ගෙය විකිණීව හැරගත්තවුන් ගෙයිත් හින්ද නොදී නෙරි හෙයින් ඇඹේණියන් කැඳවා ගෙන අනුන්ගේ බිතක්කනකට පලා ගොසින් රඳා හිඳිනාහු කබල් කෙටි හැර ගෙන සිහා ඇවිද බොහෝ දෙනා කා අන්තයේ ලූ බත් කන්ට පටන් ගත්හ. තමන් කොට පූ පරිත්‍යාග ලෙසට ම නිකෘෂ්ට ජීවිකා වි ය.

1.ඉරි ඇඳි පදවල අරුත් ලියන්න 2. මෙහි ඇති යුගල පද 2ක් ලියන්න

3.මෙම වචන සඳහා ඡේදයේ යෙදී ඇති වචන මොනවා ද? 1. අඹුව 2. මහලු 3. අගුව

4. ගෙය මිල දී ගත් අය මහලු යුවල සම්බන්ධයෙන් ගත් ක්‍රියා මාර්ගය කුමක් ද?

5.ඡේදයේ සඳහන් ප්‍රථම පුරුෂ බහු වචන ආඛ්‍යාත පද 2ක් ලියන්න (4 ×5 )

6) කෙටි පිළිතුරු සපයන්න

1.තුළ , තුල යන පද දෙකෙහි නිවැරදි අර්ථ ගැන්වෙන සේ එක් වාක්‍යයක යොදන්න

2.සෞම්‍ය , ශශිකලා , දිනිති , නයෝමි , නෙත්සරා , නිලන්ති යන නම් අකාරාදි පිළිවෙළට සකසන්න

3. ථ , ඵ , ඪ යන අකුරුවල අල්පප්‍රාණ අකුරු යොදා වචන 3ක් ලියන්න

4. මෙම වැකියට නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද යොදා නැවත ලියන්න

*අම්මා , නගරයේ අතරමං වූ මා වෙත පැමිණෙයි.

5. අවමගුලට සහභාගී වූ බොහෝ දෙනා නිශ්ශබ්දතාව රකිති. මෙහි ඇති උපසර්ග පද දෙකක් ලියන්න (4 ×5 )

6.රචනය - මම පණිහාරක වෙමි. ( 20 )